## වසර සියයක සිරි වජිරාරාම පුස්තකාලය සහ එහි අනාගත අපේක්ෂා

### පූජ්‍ය සිරි වජිරාරාමයේ ඤාණසීහ හිමියන් විසිනි

21 වැනි සියවසේ අවශ්‍යතා සපුරාලීමට සහ බුද්ධ ධර්මය පිළිබඳ වැඩිදුර ඉගෙනීමට කැමති අයට සරිලන පරිදි නවීකරණය කිරීමේ අවශ්‍යතාව මත වසර දෙකක සංක්‍රාන්ති කාලපරිච්ඡේදයක් තුළ සිරි වජිරාරාම පුස්තකාලය පරිශීලකයන්ට වසා තබන ලදී. 2024/2568 ජූලි 14 වන දින පුස්තකාලය සඳහා ම ඉදිකරන ලද නව තෙමහල් ගොඩනැගිල්ලේ නවීකරණය කරන ලද පුස්තකාලය දෙස් විදෙස් පරිශීලකයන් සඳහා නිල වශයෙන් විවෘත කිරීමට නියමිත ය. මෙම ලිපිය එහි වසර සියයේ පැවැත්ම සහ එහි අනාගත අපේක්ෂාවන් පිළිබඳ කෙටි විස්තරයක් සපයයි.

නව පුස්තකාලයේ ගොඩනැගිල්ල ඉදිකර 2022 ජුනි 21 වන දින මහා සංඝරත්නය වෙත පූජා කරන ලද අතර නව ගොඩනැගිල්ලට අදාළව සමරු ඵලකය පහත පරිදි වේ: -

**සිරි වජිරාරාම පුස්තකාලය**

වජිරාරාමයේ ආදිකර්තෘ ප්‍රපූජ්‍ය පැළැණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් එක්රැස් කරන ලද පත්පොත් ආරක්ෂා කොට ඉදි කරවන ලද මෙ ම ඓතිහාසික පුස්තකාලය 1924 ජූලි 15 දින එවක ශ්‍රී ලංකාවේ යටත් විජිත ලේකම් ධුරය දැරූ සිසිල් ක්ලෙමන්ට් මැතිඳුන් විසින් විවෘත කරන ලද්දේ ය.

LOLC සහ බ්‍රවුන්ස් ව්‍යාපාර සමූහයේ සභාපති ශාසනමාමක සැදැහැවත් **ඉෂාර නානායක්කාර** මහාත්මාණන් විසින් සිය පියාණන් වන දානපති **රාජා මහින්ද නානායක්කාර** සුධීශයාණන්ට නිවන් සුව පතා සිය මෑණියන් වන සිරි වජිරාරාම සාසන සාවිකා සමිතියේ ගරු අනුශාසිකා **ඉන්ද්‍රා නානායක්කාර** මහාත්මනියට දිගාසී පතා ශාසනාභිවෘද්ධිකාමී සප්‍රාඥ සත්පුරුෂ සමාජයක් රටට දායාද කැරලීමේ අභිප්‍රායයෙන් මෙම නව තෙමහල් පුස්තකාලය ලෝ සසුන් වැඩ පිණිස ඉදිකරවා සඟ සතු කොට පූජා කරන ලදී.

2022/2566 ජුනි 21

නව ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ 1924 ජූලි 15 දින උත්සවාකාරයෙන් විවෘත කරන ලද මුල් පුස්තකාලයීය ගොඩනැගිල්ල පිටුපස ය. එහි පෞරාණික වටිනාකම සලකා පැරණි පුස්තකාලයේ ඉදිරි කොටස නොවෙනස් ව පැවැත්වීමට සලසා ඇත. නව ධාතු මන්දිරය පිහිටුවා ඇත්තේ එම කොටසෙහි ය. වසර සියයක් පැරණි ගොඩනැගිල්ලට සරිලන පරිදි සකස් කරන ලද නව අංග රැසකින් යුත් ධාතු මන්දිරය සිරි වජිරාරාම සාසන සාවිකා සමිතියේ වත්මන් සම්මාන සභාපතිනිය වන දානපතිනි කල්ෂා අමරසිංහ මහාත්මනිය ගේ පුරෝගාමිත්වයෙන් හා ධනව්‍යයෙන් නිමවන ලද්දකි.

> *1950 දශකයේ මුල් භාගයේ විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයකු ලෙස මා විමර්ශන කටයුතු සඳහා භාවිත කළ පැරණි වජිරාරාම පුස්තකාලය පිළිබඳ පැහැදිලි චිත්‍රයක් මා සතුව ඇත. මා පේරාදෙණියේ අධ්‍යයන කටයුතුවල යෙදුණෙන් නිවාඩු කාලය තුළ විමර්ශන කටයුතුවල දී මට වටිනා මූලාශ්‍රයක් වූයේ වජිරාරාම විහාරස්ථානයේ පුස්තකාලය යි. එහි පිළිවෙළකට තැන්පත් කර තිබූ අල්මාරි අරෙවි යතුරු පියදස්සී මහ තෙරුන් වහන්සේ අත විය. උන්වහන්සේට මගේ අවශ්‍යතා දැන්වූ විට අල්මාරියේ පහළ කොටසට පය තබා නැග මට අවශ්‍ය පොත්පත් ඉහළ රාක්කවලින් එළියට ගත් අයුරු මට තවමත් මතක ය.*
>
> *පුස්තකාලයට යාබද ව, පූජ්‍ය නාරද ස්වාමීන් වහන්සේ එවක වැඩ විසූ කාමරයෙන් පිටවන ආලින්දයේ විවෘත කළ හැකි මුදුනක් සහිත මදක් ආනත වූ කෙටි කකුල් සහිත දිග මේසයක්*

*විය. මම එය ඉදිරිපිට හිඳ සටහන් තබා ගත් ආකාරය මතක් වේ. පොත්වලට වඩා අලුත් ම තොරතුරු ලබා ගත්තේ එහි තිබූ සඟරාවලිනි. එවැන්නක් නම් EAST නමැති සඟරාව ය. ඉන්දු නිම්නයේ මොහෙන්ජොදාරෝ සහ හරප්පා යන ප්‍රදේශවල සිදු කරන ලද කැණීම්වල නවතම තොරතුරු එහි තිබුණෙන් ඉන්දීය ඉතිහාසය අධ්‍යයනය කරමින් සිටි මා හට එය මහත් උපකාරයක් විය.*

වජිරාරාම පුස්තකාලයට ආවේණික වූ උසැති පොත් අල්මාරිය අතිපූජ්‍ය පැළෑණේ වජිරඥාණ මහානායක ස්වාමින් වහන්සේ ගේ ම සැලසුම් ආකෘතියක් යැයි සිතිය හැකි ය. එසේ නම් එයට ද වසර සියයකට අධික ඉතිහාසයක් ඇත. මහරගම ධර්මායතනයේ පුස්තකාලය සැලසුම් කරන විට වජිරාරාම පුස්තකාලයේ අල්මාරිවලට අනුරූප ව එහි පොත් අල්මාරි සෑදීම අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමියන්ගේ අභිලාෂය විය. එය එසේ සිදු කරන ලද අතර, ඉන් පළමු පොත් අල්මාරිය ම-විසින් (ගිහි කල) මගේ දෙමාපියන් වෙනුවෙන් පරිත්‍යාග කිරීමට හැකි වීම ගැන සතුටු වෙමි. ඒ හා සමාන ව, අළුත් පුසතකාලයේ බිම් මහලේ ඇති උස් පොත් අල්මාරි අට සහ ප්‍රදර්ශන අල්මාරි හය ම දායක පින්වතුන්ගේ පරිත්‍යාගවලින් නිම කර ඇත. (සියලු පරිත්‍යාගශීලීන්ගේ නාම ලේඛනය මෙම සියවස් සමරු කලබේ වෙනත් තැනක සටහන් ව ඇත.)

විශාල පොත් අල්මාරි අටක් පුරවා තිබූ මුල් වජිරාරාම පුස්තකාලයේ වටිනා පොත් පත් සහ පත්‍රිකා එකතුවට ආවේණික වූ විශේෂ කතන්දරයක් ඇත. එය එහි නිර්මාතෘ අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඥාණ මහානායක ස්වාමීන් වහන්සේ ගේ වදනින් ම වජිරාරාම පුස්තකාලය යටත්විජිත ලේකම්තුමා විසින් නිල වශයෙන් විවෘත කරන ලද අවස්ථාවේ කළ කථාවෙන් දැන ගනිමු.

> "රටේ උගත්කම හා සුචරිතය දියුණුවීමට අතිශයෝපකාරී වූ කටයුත්තක් ආරම්භ කිරීම පිළිබඳ අපේ මේ තුෂ්ටිදායී ප්‍රස්තාවයෙහි අපට අනුබල දීමට ඔබතුමාණන් මෙහි පැමිණීම අපි ඉතා අගය කොට සලකමු. එමෙන් ම ඒ ගැන අපේ අවංක වූ සාදර ස්තුතිය ද පිරිනමමු.
>
> මේ ප්‍රස්තාවයෙහි විස්තර කටයුතු කරුණු බොහෝ වෙතත් එයින් ස්වල්පයක් ලුහුඬින් ප්‍රකාශ කරමි. දැන් ඔබතුමාණන් විවෘතකරන්නට යන පොත්ගුල පිළිබඳ සංක්ෂේප විවරණයක් කිරීම විශේෂයෙන් ම මෙහි ප්‍රස්තාවෝචිත වේ. මෙහි තැන්පත් කොට තිබෙන දෙදහසක් පමණ වූ පොත් පත් මේ මොහොත දක්වා මගේ පෞද්ගලික වස්තුවක් මෙන් පැවති නමුත් මින් ඔබ්බට එය පොදු ජනතාවටත් ප්‍රයෝජන ගත හැකි සේ ප්‍රසිද්ධ පොත්ගුලක් මෙන් විවෘත කරවීම මගේ අදහස වේ.
>
> මීට අවුරුදු විස්සකට පමණ පෙර හෙවත් මා විද්‍යොා්දය පිරිවෙනේ ඉගෙනීම නිමවා එයින් අස්වූ කාලයෙහි මා වෙත පොත් සියයක්වත් නොතිබුණු නමුත් පොත්පත් කියවීමේ ආශාව නම් දැඩිව පැවැතුණේ ය. එබැවින් නොයෙක් දෙනාගෙන් ණයට පොත් ඉල්ලාගෙන කියවන්නට යෑමේදී මට විඳින්නට වූ ගැහැට ඉතා බොහෝ ය. තවත් ලොකු අමාරුවක් ව පැවැත්තේ බොහෝ පන්සල් පොත්ගුල්වල බණ පොත් හැර වෙන පොත් ඉතා තුනී මතින් ඇති බව ය. සමහර තැනක තුබුණත් ඒවා දැකගැනීම පවා ඉතා අමාරු විය. එබැවින් පොත්පත් සපයන්නට සිතට ගතිමි.
>
> සාමාන්‍යයෙන් බෞද්ධ භික්ෂුවක් මුදල් සැපයීමෙන් හා ගනුදෙනු කිරීමෙන් තොරවූද, නොනෑ නොපැවරුවකුගෙන් යම් යම් දේ ඉල්ලන්නට අවසර නැත්තාවූ ද පැහැදුණු දායකයන් විසින් සිය කැමැත්තෙන් ම දුන් දෙයකින් සහ නෑදෑ කැපකරු පිරිසගෙන් ලැබෙන ස්ථිර නියමයක් නැති, ඇතැම් විට ලැබෙන බොහෝ විට නොලැබෙන ලැබීම්වලිනුත් සියලු ඕනෑ එපාකම් පිරිමසා ගතිමි. රටුන්ට අමාරුවක් දැනීමක් නොවන සේ කල්යැවීමට බැඳීසිටින්නාවූ ද රැකීරක්ෂාවක් හෝ වගකියන්නට බැඳීසිටින කෙනෙකු නැත්තාවූද, ධනය අතින් බලතොත් පෞද්ගලික වශයෙන් කිසි වටිනාකමක් නැත්තාවූද, ජීවිතයක් ගෙවන්නකු බැවින් මේ තත්ත්වයේ සිටින්නකුවූ මට මේ කටයුත්ත ඉතා අමාරු එකක් විය.

එසේවීනමුත් මගේ පියාණන්ගේ පොත්පත් නිරවුල්ව මට ලැබුණු බැවින් ද මුල හරියේදී මගේ සහෝදරයන් හා මෑණියන් විසින් අගනා පොත් රැසක් සපයා දුන් බැවින් ද මගේ පොත්ගුල ක්‍රමයෙන් වැඩෙන්නට වන. ඒ අතරට මා තුළ පොත් ගැන තිබෙන බලවත් ළැදිකම දැනගත් නොයෙක් පළාත්වල සාමාන්‍ය බෞද්ධයෝද, නෑදෑයෝද, මේ ස්ථානයේ දායක පිරිසද, නොයෙක්විට මට පොත්පත් සපයා දුන්හ. වැදගත් උගත් ක්‍රිස්තියානි මිත්‍රවරු දෙතුන්දෙනෙකුත් වටිනා සංස්කෘත ව්‍යාකරණ පොත් පඞ්ක්තියක් මගේ පොත්ගුලට පරිත්‍යාග කළහ. මගේ මිත්‍රවූද, සබ්‍රහ්මචාරීවූද භික්ෂූන්වහන්සේලාත් නොයෙක්විට නොයෙක් පොත් මට පරිත්‍යාග කළහ.

මෑතක පටන් ලංකාණ්ඩුව වෙනුවෙන් ගරුතර මහලේකම් තුමාණන් විසින් මගේ පොත්ගුලට පරිත්‍යාගකර එවන එඞ්ගලන්තයේ පාළි පොත් සමාගමේ පොත් පඞ්ක්තිය අනර්ඝවූ රාජකීය පරිත්‍යාගයකි. එමෙන් ම අළුතදී සියමේ ඔටුන්න හිමි කුමාරයාණන් විසින් මා නමට එවූ ත්‍රිපිටක අට්ඨකථා පොත් කාණ්ඩ 27 ද ඉතාම උසස් රාජකීය පූජාවකි. ලංකාවේ සත්කීර්තිමත් හේවාවිතාරණ පවුලේ සයිමන් හේවාවිතාරණ මහත්මයාගේ ධර්ම පූජාවක් හැටියට ත්‍රිපිටක මුද්‍රණ සභාවෙන් නිකුත් කරනු ලබන අට්ඨකථා සියල්ල ම පිළිවෙලින් මේ පොත්ගුලට ලැබීම ද මහත් ආධාරයෙකි.

මෙසේ පොත් ගණන ක්‍රමයෙන් වැඩෙත් වැඩෙත් ම මීට අවුරුදු කීපයකට පෙර මේවා පිළිවෙලින් තැන්පත් කර තැබීමට ස්ථානයක් නැතිකම ගැන මම සිත සිතා සිටියෙමි" (උපුටා ගැනීම: සිංහල බෞද්ධයා ජූලි 26, 1924]

හොඳ පුස්තකාලයක් සෑම විට ම බහුශ්‍රැත භාවය ලබා දෙන ඥාන කෝෂ්ඨාගාරයකි. අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙවැනි ඥාන කොෂ්ඨාගාරයක් සකස් කළේ බුදු දහම පිළිබඳ පෘථුල දැනුමක් ලබා දීමට ය. උන්වහන්සේ ඉතා ආදරයෙන් හා උනන්දුවෙන් වර්ධනය කළ එම පුස්තකාලයේ පතපොත පරිශීලනය කිරීමේ අගනා ම ප්‍රතිඵලය ලෙසට දැක්විය හැක්කේ ධර්මය හා විනය සම්බන්ධයෙන් යම් ගැටලුවක් පැනනැගුණු විට උන්වහන්සේගේ විවරණය, 'අවසාන වචනය' ලෙස එකල සැලකීම යි. එතරම් උසස් පාණ්ඩිත්‍යයක් හා විචක්ෂණත්වයක් ලැබීමට මූලික සාධකයක් වූයේ උන්වහන්සේගේ එම පුස්තකාලය යි.

පැළෑණේ මහනාහිමියන් ගේ සිසුකැලට අයත් වූවෝ නම් නාරද හිමි (1916), කඹුරුගමුවේ මහානාග හිමි (1920), දෙණිපිටියේ සුමනසිරි හිමි (1923), මඩිහේ පඤ්ඤාසීහ හිමි (1924), පියදස්සී හිමි (1934), සෝම, බේමින්ද, පඹුරන මෙත්තෙය්‍ය, අම්පිටියේ රාහුල හිමිවරුන් (1936), නාඹටුන්නේ ගුණසිරි හිමි (1937), වල්ගම සුගතනන්ද හිමි (1939), පන්විල විපස්සි හිමි (1939), ඌරුගමුවේ සේනානන්ද හිමි (1939), නේපාලයේ අමෘතානන්ද හිමි (1940), කස්සප හිමි (1947), එංගලන්ත ජාතික ඤාණවීර හිමි (1950), සහ එංගලන්ත ජාතික ඤාණමෝලි හිමි (1950) යන හිමිවරු වෙත්. 1940 ට පෙර පැවිදි වූ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ කිසිවකු බුද්ධ ධර්මය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට විශ්වවිද්‍යාලයකට හෝ පිරිවෙනකට උපාධි අපේක්ෂකයකු ලෙස ගියේ නැත. උන්වහන්සේලාගේ අධ්‍යාපනය සහ පුහුණුව අතිපූජ්‍ය පැළෑණේ වජිරඤාණ මහානායක ස්වාමීන් වහන්සේ විසින් මෙහෙයවන ලද අතර වජිරාරාම පුස්තකාලය උන්වහන්සේලාගේ ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය විය.

මහාචාර්ය ජී.පී.මලලසේකර මහතා විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ ආරම්භ කරන ලද 'විද්‍යා විශාරද' පාඨමාලාව හැදෑරීමට එවක වයස අවුරුදු විසි ගණන්වල පසු වූ පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ හිමියනට උනන්දුවක් ඇති විය. එම පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුළත් වීමට නියමිත සහතික පත් සුදුසුකම් නොතිබුණ ද මඩිහේ පඤ්ඤාසීහ හිමියන්ගේ පාළි, සංස්කෘත සහ ත්‍රිපිටක ග්‍රන්ථ පිළිබඳ දැනුම ප්‍රමාණවත් බව පවසමින් පූජ්‍ය පැළෑණේ මහනාහිමියන් විශ්වවිද්‍යාල බලධාරීන්ට ලිපියක් යවා ඇත. ඒ අනුව එම පාඨමාලාව හැදෑරීමට ඉඩ දී තිබේ. එම පාඨමාලාව සාර්ථකව නිම කිරීමට උන්වහන්සේට හැකි වීමෙන් ද තහවුරු වන්නේ වජිරාරාම පුස්තකාලයේ පූර්ණත්වය යි.

සිරි වජිරාරාම පුස්තකාලයේ න්‍යෂ්ටිය ඇති කළ අතිපූජ්‍ය පැළෑණේ වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අමිල ග්‍රන්ථ එකතුව වෙන ම එකතුවක් ලෙස පවත්වාගෙන යෑමට හැකි වූයේ නම් එය ඓතිහාසික මෙන් ම බුදුදහම හදාරන්නකුට සාකල්‍ය වටිනාකමක් ඇති විශේෂ එකතුවක් වනු ඇත. පුස්තකාලයේ පසුකාලීන වර්ධනයේදී ඒ ගැන සැලකිලිමත් වී නැත.

1955 දී අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අපවත්වීම වජිරාරාම පුස්තකාලයේ විකාශනයට දිගුකාලීන බලපෑමක් ඇති කළ බව පෙනේ. ඒ වන විට උන්වහන්සේගේ ශ්‍රාවක සිසු කැල උපසම්පදාව ලබා වසර විස්සක් ඉක්මවූ මහ තෙරවරුන් බවට පත්ව ශාසනයට සහ සමාජයට වැඩි සේවයක් කිරීමේ අටියෙන් වජිරාරාම පුද බිමෙන් නික්ම යමින් සිටියහ. උදාහරණයක් ලෙස, පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමි පූජ්‍ය අම්පිටියේ රාහුල හිමියන් සමග සිය ආචාර්යෝත්තම අතිපූජ්‍ය පැළෑණේ වජිරඤාණ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අභිලාෂයන් ඉටුකිරීමේ අටියෙන් මහරගම වැව පාරේ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය ඇරඹීමට පිටත්ව ගියහ. වජිරාරාමයේ ශාඛා විහාරස්ථාන වූ නුවරඑළියේ අශෝකාරාමය, රත්නපුර පැල්වාඩියේ බෝධිගිරිය, තෙලිජ්ජවිල සමරසිංහාරාමය, මහනුවර සේනානායකාරාමය ආදි ස්ථානවලටත් එසේ වැඩියහ. වජිරාරාම පුස්තකාලයෙන් ප්‍රයෝජන ගත හැකි නවක ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ නොමැති වීම හේතුකොටගෙන වජිරාරාම පුස්තකාලය හුදු දැනුම් නිධානයක් බවට පරිවර්තනය වූ බව කිව යුතු ය.

"තථාගතප්පවේදිතෝ භික්ඛවේ ධම්මවිනයෝ විවටෝ විරෝචති, නො පටිච්ඡන්නෝ" (අංගුත්තර නිකාය, තික නිපාත) යනුවෙන් බුදුරජාණන් වහන්සේ වරක් වදාරා ඇත. එනම් "මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මවිනය බැබළෙන්නේ විවෘත වූ විට ය. සැඟවී තිබෙන විට නොවේ." එලෙස ම පුස්තකාලයක් බැබළෙන්නේ එහි පොත්පත් රන් පත්වල ලියා තිබුව ද එය හුදෙක් ඥාන කෝෂ්ඨාගාරයක් ලෙස පමණක් සුරැකෙන විට නොව භාවිත කළ විට ය.

2009 පෙබරවාරි මස දී අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යරත්නයක් වූ පූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද අනුනාහිමි වජිරාරාමාධිපති ලෙස පත් වීම වජිරාරාම විහාරස්ථානයට නව යුගයක් උදාවීමට හේතු විය. තරුණ ජවය හා පොපියන නව අදහස්වලින් ඔප්නැගුණු උන්වහන්සේ වජිරාරාමාධිපති වීම විශාල භාග්‍යයකි.

2009 සැප්තැම්බර් 06 වැනි දින විශේෂ ගැසට් නිවේදනයක් මගින් වජිරාරාම විහාර භූමිය පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ශ්‍රීමතාණෝ, නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන ගරු ඇමති දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඇතුළු සම්භාවනීය පිරිසක් මධ්‍යයේ, ඊට අදාළ සන්නස් පත්‍රය භාර දුන්හ. එදින ම අපවත් වී වදාළ තම ආචාර්යෝත්තම අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක හිමිපාණන් වහන්සේට ගෞරව දැක්වීමක් වශයෙන්, උන්වහන්සේගේ ජීවමාන පිළිරුවක් අනාවරණය කෙරිණි. එදින 'වජිරාරාමය' යන නම 'සිරි වජිරාරාමය' ලෙස වෙනස් කිරීමත් සමග 'වජිරාරාම පුස්තකාලය' යන්න 'සිරි වජිරාරාම පුස්තකාලය' ලෙස හඳුන්වන්නට යෙදුණි.

එය හුදු නම් වෙනස් කිරීමක් පමණක් නොව පුස්තකාලය පිළිබඳ සංජානනයෙහි වෙනස් කිරීමක් විය. තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ සම්බුද්ධත්වයෙන් වසර 2600 ක් සපිරෙන බුද්ධ වර්ෂ 2555හේ හෙවත් ව්‍යවහාර වර්ෂ 2011හේ වෙසක් පුණු පොහොය දින සිට වසරක් 'පිළිවෙතින් පෙළ ගැසෙමු' උද්‍යොග පාඨය ඔස්සේ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීමට ත්‍රෛනිකායික මහනාහිමිවරුන්ගේ ආශීර්වාදයෙන් රජයේ පූර්ණ අනුග්‍රහයෙන් විසි වැදෑරුම් වැඩසටහනක් ක්‍රියාත්මක විය. ඒ සඳහා සිරි වජිරාරාමයේ දායකත්වය ලෙස සිරි වජිරාරාම පුස්තකාලයේ පහසුකම් වැඩිදියුණු කිරීම විහාරාධිපති මහනාහිමියන්ගේ අනුශාසනය විය. ඉඩ මදකම නිසා අගනා පුස්කොළ පොත් 210 ක් ඇතුළු ව පොත්වලින් සපිරුණු පොත් අල්මාරි 11ක් දෙමහල් ධර්ම ශාලා ගොඩනැගිල්ලේ පළමු මහලේ තාවකාලික ව තබා තිබුණි. පුස්තාල පරිශීලකයන් සඳහා කියවීම්

පහසුකම් ද නො තිබිණි. 'නුවණ කුටිය' ලෙස හැඳින්වූ නව කියවීම් කාමරය විවෘත කිරීම නිමිත්තෙන් මුද්‍රණය කරන ලද 2555/2011.10.05 දිනැති ප්‍රකාශනයෙහි මෙම පුස්තකාල ප්‍රතිසංවර්ධන කටයුතුවල අරමුණ ලෙස සඳහන් කර ඇත්තේ මෙසේ ය.

'වත්මන් ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ දෙස් විදෙස් මහා සංඝරත්නය සහ ගිහි පර්යේෂකයන්ගේ ප්‍රයෝජනය සඳහාත් සිරි වජිරාරාම පුස්තකාලය ශ්‍රී ලංකාවේ බෞද්ධ පුස්තකාල අතර නිසි තැන ලබා ගැනීම සඳහාත් නැවත ගොඩනැගීම හා යථා තත්ත්වයට පත්කිරීම යි". පූර්වෝක්ත අරමුණෙහි *'නැවත ගොඩනැගීම හා යථා තත්ත්වයට පත්කිරීම'* යන වචනවලින් එකල සිරි වජිරාරාම පුස්තකාලයේ තත්ත්වය පිළිබඳ මනා තක්සේරුවක් ලබා ගත හැකි ය.

අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහානායක ස්වාමීන් වහන්සේ හිටපු ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න මහාත්මා සමග ඉදිරි වැඩසටහනක් ගැන සාකච්ඡා කළහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පීඨයේ මහාචාර්ය පියදාස රණසිංහ, මහාචාර්ය ඩබ්ලිව්.ඒ. වීරසූරිය, සහ ප්‍රියංවදා වනිගසූරිය යන මහාත්ම මහාත්මනීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සිරි වජිරාරාමයට පැමිණ පුස්තකාලය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව පුස්තකාලයේ පහසුකම් අදියර කිහිපයකින් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහි ප්‍රධාන අදියර සතර මෙසේ ය.

1. පුස්තකාලයීය පොත් යළි සැකසීම සහ වර්ගීකරණය;

2. කියවීම් සහ විමර්ශන පහසුකම් දියුණු කිරීම සහ පුස්තකාලයට අයත් සියලු ම පොත් අල්මාරි එක ම ස්ථානයකට ගෙනඒම සඳහා පුස්තකාලයේ ඉඩ ප්‍රමාණය වැඩි කිරීම;

3. අබලන් තත්ත්වයේ පැවති පොත්පත් හා පුස්කොළ පොත් සංරක්ෂණය කිරීම; සහ

4. පුස්තකාලය පරිගණකගත කිරීම.

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විහාරාධිපතීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් වජිරාරාම කාර්යසාධක සමිතියේ පහත සඳහන් සාමාජික හතර දෙනාගෙන් යුත් පුස්තකාල කමිටුවක් පිහිටුවන ලදී. දේශබන්ධු ඕල්කට් ගුණසේකර (ජ්‍යෙෂ්ඨ උප අනුශාසක), සඳුන් අබේගුණවර්ධන (ගරු ලේකම්), චාමර කුලසිංහ (උප භාණ්ඩාගාරික) සහ සේනක ඒ සමරසිංහ මහතා (සාමාජික සහ කැඳවුම්කරු) එසේ පත් වූ සතර දෙනා ය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පීඨයේ ප්‍රධානී ආචාර්ය ඩබ්ලිව්.ඒ.වීරසූරිය මහතා ආරාධනයෙන් උපදේශක ලෙස රැස්වීම්වලට සහභාගි විය.

මිලින්ද මොරගොඩ මහතාගේ මෙහෙයීමෙන් එන්.යූ. ජයවර්ධන භාරය මගින් ලබා දෙන ලද මූල්‍ය ආධාර උපයෝගී කරගනිමින් භෞතික දිගු කිරීම් අවසන් කරන ලදී. තවද අවශ්‍ය ගෘහ භාණ්ඩ ද මිලට ගන්නා ලදී. ඒ නිමිත්තෙන් අනාවරණය කරන ලද සමරු ඵලකය මෙසේ ය.

**යුඤ්ජථ බුද්ධසාසනේ**
2600 සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය සිහිකිරීම හා අග්ගමහාපණ්ඩිත
අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නා හිමි සමරු උපහාරය පිණිස මෙම
**දේශමාන්‍ය එන්.යූ. ජයවර්ධන නුවණ කුටිය**
එන්.යූ. ජයවර්ධන භාරය විසින් කරවා සිරි වජිරාරාම පුස්තකාලයට පූජා කරන ලදී.
2555/2011.10.05

මෙය සිරි වජිරාරාම පුස්තකාල ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පීඨයේ සහාය ඇතිව ව්‍යාපෘතියේ අයිතම 1, 3, සහ 4 සම්බන්ධයෙන් ද වැඩ අරඹන ලදී. පළමු වතාවට ඩිවි දශම වර්ගීකරණය අනුව පොත් වර්ගීකරණයක් සිදු විය. ඉන් පසුව ප්‍රවේශ ලේඛනයක් අරඹා අදාළ විස්තර ඇතුළත් කරන්නට යෙදුණි. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා පීඨයේ ප්‍රධානී ආචාර්ය ඩබ්ලිව්.ඒ.වීරසූරිය මහතාගේ අධීක්ෂණය යටතේ එම අංශයේ ශිෂ්‍යයන් උපයෝගී කර ගනිමින් පුස්තකාලයට පරිත්‍යාග කළ පරිගණකයකට අවශ්‍ය දත්ත ඇතුළත් කරන ලදී. මෙම කටයුතු සිදු කරන ලද්දේ එකඟ වූ ක්‍රමවේදයක් අනුව ශිෂ්‍යයන්ට ගෙවීමක් කිරීමෙනි. එම වැඩකටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ගිහි පුස්තකාලයාධිපතිවරයකු ද පත් කර ඇත.

2014 වසරේ දී අතිපූජ්‍ය වැලිගම ඤාණරතන මහනාහිමියන්ගේ අපවත්වීමෙන් පසු සිරි වජිරාරාමාධිපති පූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද අනුනාහිමි අමරපුර ශ්‍රී ධර්මරක්ෂිත නිකායයේ මහනාහිමි පදවියට පත් විය. ඉන් අනතුරුව වඩා හොඳ කළමනාකරණයක් සහ වැඩි කාර්යක්ෂමතාවක් සඳහා සමහර කාර්යයන් සිරි වජිරාරාමයේ භික්ෂූන් වෙත පවරන ලදී. 2016 දී පැරණි සම්ප්‍රදායක් අනුගමනය කරමින් පුස්තකාලය භාර ව සිරි වජිරාරාමයේ භික්ෂුවක් පත් කරන ලදී. ඒ පත්වීමත් සමග ම පුස්තකාල කමිටුවක් ද පත් කරන්නට යෙදුණි. එම කමිටුවේ සාමාජිකයන් වූයේ පුස්තකාලය භාර ස්වාමීන් වහන්සේ වන කුරුණෑගල චරණධම්ම හිමි, සිරි වජිරාරාමයේ ඤාණසීහ හිමි, සඳුන් අබේගුණවර්ධන මහාත්මා, තුංගසිරි ගමගේ මහාත්මා (කමිටු ලේකම්) සහ ජිතේන්ද්‍ර ගුණතිලක මහාත්මා ය. 2019 වසරේ දී පුස්තකාලය භාර ස්වාමීන් වහන්සේ ලෙසට බණ්ඩාරවෙල ඤාණරුචි හිමි පත් විය.

පුස්තකාල කමිටුවේ පළමු රැස්වීම 2016 ජූලි මස 08 දින පැවැත්විණි. එම රැස්වීමේදී ම පුස්තකාලය භාර හිමි නම විසින් බොහෝ ගැටලු මතු කරන ලදී. බරපතළ ම කරුණ වූයේ පෙර ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් පුස්තකාලයේ පොත් සම්බන්ධයෙන් සියලු ම දත්ත ඇතුළත් කර තිබූ පරිගණකය අක්‍රිය වී තිබීම යි. පුස්තකාල කොටසේ වහලයෙන් සාමාන්‍ය වැස්සක දී පවා තෙමීමත් අධික වර්ෂාපතනයක් ඇති වූ විට ජලය ඇතුළට ගලා ඒමත් නිති පතා සිදු වූවකි. වැසි ජල ප්‍රශ්නය වඩාත් බලපෑවේ දුර්ලභ හා ස්ථිර විමර්ශන පොත් ස්ථානගත කළ කොටසේ ය. පුස්තකාලයේ ප්‍රසාරණය සඳහා ඉඩකඩ නොමැතිකම ද උග්‍ර ගැටලුවක් බවට පත්වෙමින් තිබිණි.

පූර්වෝක්ත කරුණු සලකා පූජ්‍ය නාරද මාහිමිපාණන් සහ පූජ්‍ය කස්සප හිමිපාණන් මුල් අවදියේ දී වැඩ විසූ කුටි දෙක ඇතුළු ව ඉදිරි කොටස එහි පෞරාණිකත්වය සලකා එලෙස ම තිබෙන්නට හරිමින් පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ පසුපස කොටස කඩා නව ගොඩනැගිල්ලක් තැනීමට තීරණය කරන්නට යෙදුණි. මුලදී නව තෙමහල් ගොඩනැගිල්ල 1924 දී විවෘත කරන ලද මුල් වජිරාරාම පුස්තකාල ගොඩනැගිල්ලේ දිගුවක් ලෙස ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද පසුව එය ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. නමුත් පැරණි ගොඩනැගිල්ලේ ගෘහනිර්මාණ ලක්ෂණයක් ලෙස සැලකිය හැකි පුළුල් ආලින්දයක් මගින් නව ගොඩනැගිල්ල පැරණි ගොඩනැගිල්ලට සම්බන්ධ කර ඇත. පුස්තකාල නව ගොඩනැගිල්ල 2022 දී විවෘත කිරීමත් සමග මුලින් ම පුස්තකාලය තිබූ කොටස සිරි වජිරාරාම විහාරස්ථානයේ ධාතු මන්දිරය ලෙස නව සැකැසුම් සහිත ව නිර්මාණය කොට 2568/2024 ජූනි 21 වන දින මහජන පුද හරසරට විවෘත කරන ලදී.

නව ගොඩනැගිල්ලේ සැලසුම් ඇඳීමේ කාර්යය විහාරස්ථානයේ දායකයකු වන වරලත් ගෘහනිර්මාණ ශිල්පී රංග දයාසේන මහතාට පැවරිණි. එම පැවරුම ලැබීම එතුමාගේ භාග්‍යයක් ලෙස සලකා කුසල් සිත් පෙරදැරිව කර දෙන්නට යෙදුණි. යෝජිත තෙමහල් ගොඩනැගිල්ලේ විස්තීර්ණ සැලසුම් එතුමාගේ ඇක්සිස් වරලත් වාස්තුවිද්‍යා සමාගම විසින් ලබා දෙන ලද අතර සාකච්ඡා වට කිහිපයකින් පසුව අනුමත කරන ලදී. පුස්තකාලය පවත්වාගෙන ගිය පැරණි ගොඩනැගිල්ලේ අදාළ කොටසෙහි තිබූ පොත්, අල්මාරි සහ අනෙකුත් සියලු ම ගෘහ භාණ්ඩ හා

උපකරණ වෙනත් තැනකට ගෙන යෑමෙන් පසු 2021 මාර්තු වන විට කොන්ත්‍රාත්කරුවන්ට භාර දිය යුතුව තිබිණි. පොත් අල්මාරි 26 සඳහා තාවකාලික සෙවණක් දාන ශාලාවේ කොටසක සහ සංඝාවාසයේ කොරිඩෝවේ ලබා දෙන ලදී. කණ්ඩායම් ක්‍රියාකාරිත්වය සහ අදාළ සියලු දෙනාගේ කැපවීම නිසා ඉලක්කගත දිනට භාරදීමට හැකි විය.

වසර සියයක් යනු සාපේක්ෂව දිගු කාල පරිච්ඡේදයකි. අවුරුදු සියයක් ජීවත් වන්නේ ස්වල්ප දෙනකු පමණි. අනෙක් අතට, දැනුම් සම්භාරය ලෝකයේ නිරන්තරයෙන් වර්ධනය වන්නකි. එම නව දැනුමෙන් පුස්තකාලයක් පෝෂණය නොවුණ හොත් පුස්තකාලයක් යල්පැන යා හැකි ය. එසේ නොවන්නට නම් වාර්ෂික ව පුස්තකාලයේ ගුණාත්මක වර්ධනයට අරමුදල් වෙන් කළ යුතුව ඇත.

සිරි වජිරාරාම පුස්තකාලයේ ආරම්භක අවදියේ අපවත්වී වදාළ අතිපූජ්‍ය පැළෑණේ වජිරඥාණ මහානාහිමියන්ගේ පත්පොත් කෙරෙහි තිබූ ඇල්ම නිසා අවශ්‍ය පොතපත විවිධ ධාර්මික ක්‍රම මගින් ලබාගත් අයුරු උන්වහන්සේගේ වචනවලින් ම කලින් දක්වා ඇත. එම එකතුව කෙතරම් විශිෂ්ට ද කියත හොත් ශ්‍රීමත් ඩී.බී.ජයතිලක, මහාචාර්ය ජී.පී. මලලසේකර, ඩබ්ලිව්.ඒ. සිල්වා වැනි විද්වත්හු පුස්තකාලයේ පරිශීලකයන් අතර වූහ. විද්‍යෝදය පිරිවෙන් පුස්තකාලය සහ කෞතුකාගාර පුස්තකාලය අතරට එකල තිබූ තෙවැන්න වජිරාරාම පුස්තකාලය යි. පුස්තකාලය පොත් සංඛ්‍යාවෙන් වර්ධනය වූව ද එය බොහෝ දුරට පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් මත රඳා පැවතිණි. පරිශීලකයන්ගේ බහුශ්‍රැතභාවය හා නිපුණත්වය වර්ධනය කිරීම වෙනුවෙන් නව දැනුමෙන් සන්නද්ධ කිරීම සඳහා පොත් සහ/හෝ සඟරා ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තියක් අනුව අත්පත් කර ගැනීමක් සිදු වී නොමැත. පුස්තකාලය සිරි වජිරාරාමයේ අතීත ඉතිහාසයේ වැදගත් කොටසක් ලෙස පමණක් සලකනු ලැබූ අතර එහි ගුණාත්මක වර්ධනයට අරමුදල් වෙන් කිරීමක් සිදු වී නැති බව නිරීක්ෂණය විය. මෙම මානසිකත්වයේ වෙනසක් ඇති කිරීමට යම් කාලයක් ගත වන නමුත් එවැන්නක් සිදුවීම පුස්තකාලයේ අනාගත වර්ධනයට හා වර්තමාන ප්‍රවණතාව රැකගැනීමට අනිවාර්යයෙන් ම විය යුත්තකි.

අතීතයෙන් පාඩම් ඉගෙන, විහාරාධිපතීන් වහන්සේ ලෙස අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේගේ ආශිර්වාදය සහ අනුමැතිය ඇතිව යම් යම් පියවර ගෙන ඇත. සිරි වජිරාරාම පුස්තකාලයට වෙන ම අනන්‍යතාවක් ලබා දීම වැදගත් සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකි ය. නව වර්ධනයන් සමග පැළෑණේ මහනාසමිඳාණන්ගේ උතුම් සංකල්පනාවලට අනුකූලවන පරිදි සිරි වජිරාරාම පුස්තකාලයට වෙන ම දැක්මක් සහ මෙහෙවර ප්‍රකාශයක් ද වෙන ම ලාංඡනයක් ද දැන් ඇත. ඒ සියල්ල ම පළමු වරට පුස්තකාලය සඳහා සකස් කරන ලද ව්‍යවස්ථා මාලාවට ඇතුළත් කර ඇත. එමගින් අනුමත ආයතනික ව්‍යුහයක් තුළ පුස්තකාලයේ අනාගත ක්‍රියාකාරිත්වය සඳහා පුළුල් රාමුවක් සපයා ඇත. ප්‍රතිග්‍රහණ හෙවත් පොත්පත් අත්පත් කර ගැනීම, පුස්තකාල එකතුව පුළුල් කිරීම, පොත්පත් අපහරණය, නඩත්තු කිරීම සහ කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීමට විධිවිධාන එහි අඩංගු කර ඇත. සිරි වජිරාරාම පුස්තකාලයීය කමිටුව, සිරි වජිරාරාම පුස්තකාලයානුබද්ධ සංවර්ධන කමිටුව ලෙස නම් කර එහි සභාපති වශයෙන් සිරි වජිරාරාම කාර්යසාධක සමිතියේ ජ්‍යෙෂ්ඨ උප සභාපති එන්.කේ. ඉලංගකෝන් මහතා පත් කරන්නට යෙදුණි. අනෙකුත් සාමාජිකයන් වනුයේ පූජ්‍ය සිරි වජිරාරාමයේ ඤාණසීහ හිමි (අනුශාසක), පුස්තකාලය භාර පූජ්‍ය බටුවත්තේ ධම්මානන්ද හිමි, තුංගසිරි ගමගේ මහතා (ගරු ලේකම් සහ වාර්තාකරු), සඳුන් අබේගුණවර්ධන මහාත්මා, කුමුදු ජයතිලක මහාත්මා, දිත්ත ද අල්විස් මහාත්මා, මහාචාර්ය ප්‍රියන්ත හේවාගමගේ මහාත්මා, මුදිතා මදනායක මහාත්මනිය, උපේඛා සිරිවර්ධන මහාත්මනිය, රුක්මණී කුමාරජීව මහාත්මනිය යි. පසුව චන්ද්‍රානි ගමගේ මහාත්මනිය සහ වයලා කටුවන්දෙණිය මහාත්මනිය ඇතුළු කර සිරි වජිරාරාම පුස්තකාලයේ ශත සංවත්සර සැමරුම් කමිටුව පිහිටුවීමට කටයුතු කරන ලදී. ඉලංගකෝන් මහතා හරහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සමඟ ඉතා සමීප සබඳතාවක් ද වර්ධනය විය.

අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහනාහිමියන්ගේ අත්සනින් 2023.03.21 දිනැති විධිමත් ලිපියක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ සභාපති මහාචාර්ය නන්ද ධර්මරත්න වෙත යවන ලදී. බුද්ධධර්මය දැනගැනීමට ලොව පුරා මහත් උනන්දුවක් පවතින කාල වකවානුවක බුදු දහම පිළිබඳව වැඩි විස්තර ක්ෂණික ව ලබා ගැනීම, සහ පුස්තකාල විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක්, පුස්තකාලයේ ස්වයංක්‍රියකරණය සහ මනා පුස්තකාල කළමනාකරණයකට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම ආදියට විශේෂිතව, වත්මනට ගැළපෙන පරිදි සිරි වජිරාරාම පුස්තකාලය නවීකරණය කිරීම සඳහා ඉන් සහාය ඉල්ලා සිටියේ ය.

යවන ලද ලිපියට ප්‍රතිචාර වශයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ සභාපතිතුමාගේ මෙහෙයීම පරිදි කාර්ය මණ්ඩලයේ කිහිප දෙනකු විසින් පුස්තකාලය අඩුපාඩු අධ්‍යයනය කිරීමෙන් පසු තත්ත්ව වාර්තාවක් එවන ලදී. ඒ අනුව සිරි වජිරාරාමයේ නේවාසික භික්ෂූන් වහන්සේ දෙනමකට සහ වජිරාරාම දහම් පාසලේ දෙදෙනකුට සතියක ක්‍රමවත් පුහුණුවක් ලබා දෙන ලදී. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සමග සියලු කටයුතු මනාව සම්බන්ධී කරන ලද්දේ එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වන ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ මහාත්මා විසිනි. 2023 සැප්තැම්බර් 18 වැනි දින සිරි වජිරාරාමයේ දී අතිපූජ්‍ය තිරිකුණාමලේ ආනන්ද මහානායක හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධරයන් සමග විධිමත් රැස්වීමක් පැවැත්වුණු අතර, එහි දී ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම තීරණය කරනු ලැබිණි. ඉන් පසුව ඇති වූ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තරයක් දැනට පුස්තකාලය භාරව සිටින බටුවත්තේ ධම්මානන්ද හිමියන්ගේ ලිපියෙහි රූපමය වශයෙන් මෙම සඟරාවේ වෙනත් තැනක දකින්නට පිළිවන.

මීට පෙර 2011 දී සිදු කළ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ලත් අත්දැකීම් සැලකිල්ලට ගෙන නව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී උපායමාර්ගික වෙනසක් සිදු කරන ලදී. එනම්, ක්‍රියාත්මක කිරීමේ වගකීම බාහිර සංවිධානයකට නොපවරා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයෙන් පුහුණුව ලත් හිමි නමට පැවරීම යි. උන්වහන්සේ විසින් පුස්තකාලයාධිපති නව භූමිකාව විශාල කැපවීමකින් සහ උනන්දුවකින් කිරීම හොඳ මුල පිරීමකි. ප්‍රායෝගිකව ගුරුහරුකම් ලබා ගැනීමට උපදේශක පුස්තකාලයාධිපතිවරයෙක් පත් කරන ලදී. ඒ සඳහා 2023 දෙසැම්බර් මාසයේදී ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානයේ පුස්තකාලයාධිපති තනතුරෙන් විශ්‍රාම ලත් අත්දැකීම් බහුල ප්‍රීති ලියනගේ මහතාගේ සේවය ලබාගැනීමට සිරි වජිරාරාම පුස්තකාලය භාග්‍යවන්ත විය. ධර්මවිජය පදනම විසින් පරිත්‍යාග කරන ලද අරමුදල්වලින් 2023 අප්‍රේල් මාසයේ සිට මාස හතක කාලයක් එම උපදේශක තනතුරේ එතුමා සේවය කළේ ය. ලියනගේ මහතා දැනට ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති වන අතර ඉදිරියටත් තම දැනුම සිරි වජිරාරාම පුස්තකාලයේ වර්ධනයට ගරු සේවයක් ලෙස ප්‍රදානය කරයි.

ඒ හැරෙන්නට, පුස්තකාලයේ ඇති සියලු ම පොත් සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම, නව පරිග්‍රහණ ලේඛනයකට පොත්වල විස්තර සටහන් කිරීම, බාර්කෝඩ් ආදිය ඇතුළත් කර පොත් රාක්කවල තැබීමට අවශ්‍ය සියලු ම කටයුතු නිම කිරීම හා පොත් අල්මාරිවල ක්‍රමානුකූල ව ඇහිරීම ආදි තාක්ෂණික නොවන, එහෙත් අත්‍යවශ්‍ය, සියලු කටයුතු සඳහා සාසන සාවිකා සමිතියේ සාමාජිකාවන්ගේ ස්වේච්ඡා සේවය ලබා ගැනීම තවත් කැපී පෙනෙන වෙනසකි. මෙහි වැදගත්කම වන්නේ එම ක්‍රියාවලියෙන් ලත් අත්දැකීම් පුස්තකාලයේ ඉදිරි නඩත්තු කටයුතු සඳහා ඉතිරිව තිබීම යි. පසුගිය අවස්ථාවේදී මේ කටයුතු සිදු කරන ලද්දේ පුස්තකාල විද්‍යා පාඨමාලාව හදාළ කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් විසිනි. සිරි වජිරාරාම පුස්තකාලයීය ව්‍යවස්ථා මාලාවේ ස්වේච්ඡා කණ්ඩායමක් ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ද විධිවිධාන සලසා ඇත.

**සමාප්ති සටහන්**

නව තාක්ෂණයේ දියුණුවත් ඩිජිටල්කරණයේ වර්ධනයත් සමඟ සාමාන්‍ය පුද්ගලයකුට පවා අන්තර්ජාලය ඔස්සේ විශාල තොරතුරු සහ සම්පත් සමුදායකට ප්‍රවේශය දැන් ඇත. නිදසුනක්

වශයෙන්, බුද්ධ ජයන්ති ත්‍රිපිටක මාලාවේ වෙළුම් 52 කින් සමන්විත සම්පූර්ණ ත්‍රිපිටක පොත් වහන්සේ ඩිජිටල්කරණය හේතුවෙන් තනි යූ.එස්.බී. ධාවකයක ගෙන යා හැකි ය. පර්යේෂණ හා එවන් වෙනත් ආයතන තමන්ගේ ම වෙබ් අඩවි තිබීම හේතුවෙන් ද පුස්තකාල පවත්වා ගෙන යෑමේ තරගයකට මුහුණ පා ඇත. මෙයින් අදහස් කරන්නේ අනාගතයේ සාම්ප්‍රදායික පුස්තකාලවල පැවැත්ම අතිශයින් ම අභියෝගාත්මක වන බවයි. එබැවින්, ඉතා ආකර්ෂණීය අන්දමට පවත්වා ගනිමින් පුස්තකාලයේ පුළුල් දොරටු විවෘත ව තබා පරිශීලකයන් පුස්තකාලය වෙත පැමිණෙන තෙක් අකර්මණ්‍ය ව බලා සිටීමේ භූමිකාව නොව අවශ්‍ය වන්නේ අනාගත පරිශීලකයන්ගේ දොරකඩට දැනුම ගෙන ඒම සඳහා ආක්‍රමණශීලී ක්‍රියාකාරී භූමිකාවක් ය.

සම්බුද්ධත්වයට පත්වීමෙන් පසු බුදුරදුන්ගේ කාහල නාදය වූයේ ***'අපාරුතා තේසං අමතස්ස ද්වාරා - යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං'*** යන්නයි. එහි අදහස නම් *'අමරණීයත්වයට පිවිසෙන දොරටුව විවෘත කරන ලදී - කන් ඇත්තාහු ශ්‍රද්ධාවෙන් යුතුව සවන් දෙත්වා'* යන්න යි. ප්‍රතිසංස්කරණය කරන ලද සිරි වජිරාරාම පුස්තකාලයේ ලාංඡනය ලෙස මෙහි මුල් වදන් යොදා ඇත. බුදුරජාණන් වහන්සේ සිය කාහල නාදයෙන් පසු ජනයා තමන් වෙත පැමිණෙන තෙක් අක්‍රිය ව බලා සිටියේ නැත. ඒ වෙනුවට උන්වහන්සේ සිය ගෝල භික්ෂු සංඝයා සමග උතුරු ඉන්දියාවේ මහාමාර්ගවල සහ අතුරු මාර්ගවල වඩිමින් සාමයේ සහ අමරණීයත්වයේ පණිවිඩය ජනතාව වෙත ගෙන ගිය සේක. එය ඉතා වෙහෙසකාරී විය. බුදුරදුන්ගේ අඩිපාරේ යමින් සිරි වජිරාරාම පුස්තකාලය බුදු දහම පිළිබඳ විශිෂ්ට සම්පත් මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීමත් නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් බුද්ධ ධර්මයේ මාහැඟි පණිවිඩය අපේක්ෂා කරන සෑම කෙනෙකුට ම ප්‍රවේශ විය හැකි අයුරින් තැබීමත් සිරි වජිරාරාම පුස්තකාලය ඉදිරියේ ඇති අභියෝගය යි.

**මා නිවත්ත අභික්කම!!!**